C
373

# ශිෂ්‍ය, ගුරු, අපේක්ෂා හා විභාග ප්‍රතිඵල අතර සබැඳියාව

(අ.පො.ස.උසස් පෙළ විභාගය ඇසුරින් පාසල් මට්ටමේ විමසීමකි.)

සී.ඇප්.බී.රැළපනාව බී.ඒ.(ගෞරව) අධ්‍යාපන ඩිප්. (විශිෂ්ට)

නිබන්ධන උපදේශක
ආචාර්ය එම්.යූ.සේදර

අධ්‍යාපනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සඳහා අර්ධ පූර්ණ
අවශ්‍යතාවක් ලෙස, පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ
අධ්‍යාපන අධ්‍යයනාංශය වෙත ඉදිරිපත් කරන ලද
පර්යේෂණ නිබන්ධනය

1984 සැප්තැම්බර්

## සාරාංශය


ශාස්ත්‍රීය සාධනය පිළිබඳ ශිෂ්‍ය අපේක්ෂා ගුරු අපේක්ෂා හා සාධන මට්ටම් අතර සබැඳියාව විමසීම අධ්‍යාපන මිනුම් ක්ෂේත්‍රය තුළ කාලීන සංකල්පයකි. මෙම ක්ෂේත්‍රය පිළිබඳ පර්යේෂණ සාහිත්‍යයෙහි විශේෂතාවය නම් එය තුල හමුවන විවිධ අධ්‍යයනවල ප්‍රතිඵල තුලින් පරස්පර තොරතුරු හෙළි වීමයි. එය, මෙම ක්ෂේත්‍රය සතු මිනුම් උපකරණවල ඌනතාවන් පෙන්නුම් කරන අතර, මේ පිළිබඳව වැඩිදුර පර්යේෂණයට හා පර්යේෂණ මාර්ග සෙවීමට ඇති අවශ්‍යතාව පෙන්නුම් කරයි. එම පුළුල් කාර්යයෙහි එක් අංශයක් ලෙස අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය පදනම් කර ශාස්ත්‍රීය සාධනය පිළිබඳ ශිෂ්‍ය අපේක්ෂා, ගුරු අපේක්ෂා හා විභාග ප්‍රතිඵල අතර සබැඳියාව විමසීමද, එම අපේක්ෂා පිළිබඳ ශිෂ්‍ය ප්‍රමාණන හා ගුරු ප්‍රමාණන වල නිර්ණායක වලංගුතාව පරීක්ෂා කිරීම ද මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණු විය. මේ සඳහා මහනුවර දිස්ත්‍රික්කයේ පාසල් පදනම් කර නියැදි අධ්‍යයනයන් කරන ලදී.

මෙම අධ්‍යයනයේදී ශිෂ්‍ය අපේක්ෂා යනු සිසුන් සිය ශාස්ත්‍රීය සාධනය පිළිබඳව කඩාගන්නා අපේක්ෂාවන් ලෙස සැලකෙන අතර; ඔවුන් තම පාඨමාලාව අවසානයේ දී ශිෂ්‍ය කැරුම්සරිය පිළිබඳව කරනු ලබන සවයං ඇගයුමකින් ශිෂ්‍ය අපේක්ෂා හෙළිවෙතැයි සළකනු ලැබීය. ගුරුවරුනට සිය ශිෂ්‍යයන් අධ්‍යයන කටයුතුවල නිරතවන ආකාරය පිළිබඳව අවබෝධයක් ලැබෙන අතර එම තොරතුරු නිසා ගුරුවරයා සිය ශිෂ්‍යයන්ගේ කැරුම්සරිය පිළිබඳව අපේක්ෂා ඇතිකරගනී. ගුරුවරුන් සිය ඇගයුම් වලදී සිසුනට පවරනු ලබන ලකුණු හෝ ශ්‍රේණි වලින් ගුරු අපේක්ෂා හෙළිවේ. ශාස්ත්‍රීය සාධනය පිළිබඳ ශිෂ්‍ය හා ගුරු අපේක්ෂාවල සාර්ථක හෝ අසාර්ථකත්වය හඳුනාගත හැක්කේ සාධන මට්ටම් මැනීමෙනි. ශිෂ්‍ය ශාස්ත්‍රීය සාධන-මට්ටම් තීරණය කිරීමෙහිලා මිනුම් උපකරණයක් ලෙස අද ප්‍රචලිත ලෙස සාධන පරීක්ෂණ යොදාගනු ලබන හෙයින් මෙම අධ්‍යයනයේ දී ද ඒ සඳහා සාධන පරීක්ෂණයක් වන අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය යොදා ගැනුණි. එම විභාගයේ ප්‍රතිඵල පිළිබඳව ශ්‍රේණිවලින් ශිෂ්‍ය සාධන මට්ටම් හෙළි වෙතැයි උපකල්පනය කෙරුණි.

පර්යේෂණයට ලක්වූ පාසල්වල අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයට පෙනී සිටින සිසුනට සිය පාඨමාලාව අවසානයේදී තම කැරැම්සරිය පිළිබඳව සලකා බලා විභාගයේ දී අපේක්ෂිත ප්‍රතිඵල පිළිබඳව ස්වයං ප්‍රමාණනයක් කිරීමට ඉඩ සළසන ලදී. ශිෂ්‍ය ශාස්ත්‍රීය සාධනය පිළිබඳව සලකා බලා ඔවුනට විභාගයේ දී අපේක්ෂා කළ හැකි ප්‍රතිඵල පිළිබඳව පෙරකිමක් වශයෙන් ශ්‍රේණියක් පවරන ලෙස එම ශිෂ්‍යයනට උසස්පෙළ පන්තිවල විෂයයන් උගැන්වූ ගුරුවරුන්ගෙන් ද ඉල්ලා සිටින ලදී. අනතුරුව අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ දී අපේක්ෂිත ප්‍රතිඵල පිළිබඳ ශිෂ්‍ය ස්වයං-ප්‍රමාණන ගුරු ප්‍රමාණන හා විභාග ප්‍රතිඵල අතර සංගතතාව අවබෝධ කර ගැනීම සඳහා මෙම ප්‍රමාණන අතර සහසම්බන්ධතා සංගුණක ගණනය කරන ලදී. මෙම සහසම්බන්ධතා සංගුණකවල වෙසෙසියාව පරීක්ෂා කිරීම සඳහා ෆිෂර්ගේ පරිණාමන සූත්‍ර භාවිතා කරන ලද අතර ඕල්ඩ්ස්ගේ වගු ඇසුරින් ඒ ඒ සහසම්බන්ධතා සංගුණක වෙසෙසි සහසම්බන්ධතා සංගුණක දැයි විමසන ලදී.

පර්යේෂණ ප්‍රතිඵල පිළිබඳ විශ්ලේෂණයෙන් අනාවරණය වූ තොරතුරු අනුව:

1. ගුරු අපේක්ෂා හා සාධන මට්ටම් අතර ඉහළ සංගතතාවක් පවතී. එහෙයින් ගුරු ප්‍රමාණනවල විශ්වසනීයතාව යහපත් වූ අතර එම ප්‍රමාණන වල නිර්ණායක වලංගුතාව ඉහළ විය.

2. ශිෂ්‍ය අපේක්ෂා හා සාධන මට්ටම් අතර සංගතතාව මධ්‍යස්ථ විය. එහෙයින් ශිෂ්‍ය ප්‍රමාණනවල විශ්වසනීයතාව සෑහීය යුතු තරම් ඉහළ නොවූ අතර එම ප්‍රමාණන වල නිර්ණායක වලංගුතාව මධ්‍යස්ථ තරමින් පැවතුණි.

3. ශිෂ්‍ය අපේක්ෂා හා ගුරු අපේක්ෂා අතර පහළ මට්ටමේ සංගතතාවක් පැවතුන හෙයින් එම ප්‍රමාණන අතර අන්තර් සම්බන්ධතාවය යහපත් නොවීය.

4. ශිෂ්‍ය ප්‍රමාණන ගුරු ප්‍රමාණන හා විභාග ප්‍රතිඵල අතර සංගතතාවන්හි ස්ත්‍රී පුරුෂ වශයෙන් වෙනස්කමක් දක්නට ලැබුණු අතර එම ප්‍රමාණන වලදී වඩාත් නිවැරදි ප්‍රතිචාරයක් දැක්වූයේ ගැහැණු ළමයින්ය.

5. ශිෂ්‍ය ප්‍රමාණන, ගුරු ප්‍රමාණන හා විභාග ප්‍රතිඵල අතර සංගතතාවන්හි නාගරික හා ග්‍රාමීය වශයෙන් වෙනස්කමක් දක්නට ලැබුණ අතර එම ප්‍රමාණන වලදී වඩාත් නිවැරදි ප්‍රතිභාරයක් දක්වා තිබුණේ නාගරික නියැදින්ය.

පේරාදෙණිය විශ්ව විද්‍යාලය
පුස්තකාලය
1986-2-01
පේ රා දෙ ණි යු

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY